{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகானம்
Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 03 යි |
|---|---|---|

අමතර කියවීම් කාලය - මි. 10 යි

# නාට්‍ය හා රංග කලාව - I

57 S I

ඇතුළත්වීමේ අංකය :- ..........................................................

උපදෙස් :

I කොටස - සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

II කොටස - A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

01. නාට්‍ය නම් වූ පංචම වේදය නිර්මාණය කිරීමේ දී මහබඹු විසින් "රසය" උකහා ගනු ලැබුයේ,
   1. ඍග් වේදයෙනි 2. යජුර් වේදයෙනි 3. සාම වේදයෙනි
   4. අථර්ව වේදයෙනි 5. ඍග් හා යජුර් වේදයන්ගෙනි (........)

02. නාට්‍ය ශාස්ත්‍රයට අනුව දිව්‍ය ලෝකයේ නිෂ්පාදනය කරන ලද ප්‍රථම නාට්‍ය වන්නේ කුමක් ද?
   1. මෘච්ඡකටිකය 2. අමෘතමන්ථනය 3. නාගානන්දය
   4. ප්‍රියදර්ශිකාය 5. මාලවිකාග්නිමිත්‍රය (........)

03. සංස්කෘත නාට්‍ය ගෘහයේ විකාශය අනුව නාට්‍ය මණ්ඩප ආකාර තුන නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?
   1. ජ්‍යෙෂ්ඨ, මධ්‍යම, අවර 2. බීජ, බිංදු, පතාකා 3. විකෘෂ්ට, චතුරස්‍ර, ත්‍රස්‍ර
   4. මගධී, ප්‍රාච්‍යා, අවන්තී 5. උත්තම, මධ්‍යම, අධම (........)

04. නාට්‍ය ධර්මී ශෛලියේ ලක්‍ෂණ ඇතුළත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. ලෝකයේ සිදුවන යමක් වේදිකාව මත ඒ අයුරින්ම සිදු කිරීම.
   2. සැම විටම කාලීන තේමාවක් වස්තුකර ගැනීම.
   3. ඍජු අංගරචනය භාවිතයට ගැනීම.
   4. තත්වානුරූපී මායාව ඇති කිරීමට රංගභූමි අලංකරණ බහුලව යොදා ගනියි.
   5. එක් භූමිකාවක් රඟපෑමෙන් පසු නලුවාගේ දක්‍ෂතාව නිසා හෝ අන් නලුවකු නොමැති වීම නිසා නළුවා වෙනත් භූමිකා රඟපෑම. (........)

05. නෘත්ත යන්නට අදාළ නිවැරදි පිළිතුර කුමක් ද?
   1. නර්තනයන්හි තාලාන්විත බව හා දෘෂ්‍යරූපයෙහි සුන්දරත්වය දැකගත හැක.
   2. රිද්මයානුකූල චලන සමඟ අත්, පා, ඇස්, මුහුණ මගින් භාව ප්‍රකාශ කරන නර්තනයකි.
   3. නෘත්තයෙහි රිද්මයක් ද, අර්ථයක් ද, මනෝභාවයක් ද ඇත.
   4. මෙහිදී අත්දැකීම් සමූහයක්, පාත්‍රයන් මාර්ගයෙන් ප්‍රේක්‍ෂක රස ජනනය උදෙසා ඉදිරිපත් කරයි.
   5. ආංගික හා සාත්වික අභිනයට අනුරූපව මනෝභාව ප්‍රකට කරයි. (........)

06. සංස්කෘත නාට්‍යයේ වාචික අභිනයේ දී භාවිත වන ප්‍රාකෘත ප්‍රභේදයට අයත් යුගලය තෝරන්න.

1. මාගධී, ශකාරී
2. ශෞරසේනි, අර්ධමාගධී
3. චාණ්ඩාල, ආවන්ති
4. ආභීරි, ප්‍රාච්‍යා
5. බාහ්ලීකා, ශාබරී (........)

07. නාට්‍ය අධ්‍යක්ෂක සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. එංගලන්තයේ දී අධ්‍යක්ෂ (Director) ලෙසද අමරිකාවේ දී නිෂ්පාදක (Producer) ලෙස ද හැඳින්වේ.
2. චිත්‍රපට කලාවේ දී අධ්‍යක්ෂ යනු මුදල් ආයෝජකයා ය.
3. නූතන අධ්‍යක්ෂවරයා බිහිවන්නේ සැක්සේ මයිනිංගන් ආදිපාදවරයාගේ කාලයේ ය.
4. සංස්කෘත නාට්‍ය සම්ප්‍රදායේ අධ්‍යක්ෂ භූමිකාව විදූෂක වෙත පැවරෙයි.
5. ග්‍රීක, රෝම හා ෂේක්ස්පියර් නාට්‍ය කවියා විසින්ම අධ්‍යක්ෂණය කෙරිණි. (........)

08. කෙටි නාට්‍ය සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය කුමක් ද?

1. කෙටි නාට්‍ය එක් දර්ශනයකට හෝ ජවනිකාවකට පමණක් සීමා වේ.
2. එක් ගැටුම් අවස්ථාවක් පමණක් ගොඩනැගෙන ලෙස නිර්මිත රචනයක් විය යුතුය.
3. කෙටි නාට්‍ය පෙළක සංවාද ඉතාම වැදගත් ය.
4. පසුතල, රංගාලෝකය, සංගීතය වැනි ආනුෂංගික අංග යොදා ගැනීම කෙරේ වැඩි අවධානයක් යොමුකළ යුතුය.
5. ඉතා කුඩා අවකාශයක වුව ද රඟ දැක්විය හැකි නාට්‍යමය ක්‍රියාව ප්‍රබල වූ නිර්මාණයක් විය යුතුය.

(........)

09. රටයකුම ශාන්තිකර්මයේ අපේක්ෂාව හා සමාන අරමුණක් සහිත අභිචාර කර්මයක් වනුයේ,

1. ව්‍යාධදේව වන්දනය ය.
2. මත්ස්‍ය රුවක් තනා දියට දැමීම ය.
3. ගසක පළමු අස්වැන්න බඩදරු මවකට දීම ය.
4. දරුවෙක් අතින් වඩාගෙන ධාන්‍ය සිටුවීම ය.
5. බාබාර් ආකිපෙලාගෝවෙහි සිදු කරන අනුකරණාත්මක ක්‍රමය ය. (........)

10. ගඳභ, නාගසේනහිමි හා දේව දූතයා යන චරිත පිළිවෙලින් ඇතුළත් බෞද්ධ පූජා කර්ම ත්‍රිත්වය නිවැරදිව තෝරන්න.

1. ආලවක දමනය, මිලින්ද ප්‍රශ්නය, දොරකඩ අස්න
2. දොරකඩ අස්න, යුගාසන බණ, ආලවක දමනය
3. මිලින්ද ප්‍රශ්නය, යුගාසන බණ, දොරකඩ අස්න
4. දොරකඩ අස්න, මිලින්ද ප්‍රශ්නය, පිරිත් පිංකම
5. යුගාසන බණ, පිරිත් පිංකම, මිලින්ද ප්‍රශ්නය (........)

- **පහත තොරතුරු ගොනුව ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 11 සිට 16 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A - මද්දලය | B - මීරුප්පේ | C - රොලීනා |
| D - විශ්වකර්ම | E - දුටුගැමුණු | F - බම්මන්නා |
| G - තානායම්පොළ | H - අලගනායිදු | I - තඹරාවිට |
| J - ඉන්දර්සභා | K - කයිසර් ජජීර් | L - වංගෙඩිය |
| M - මඩුව | N - විශ්වනාථ් ලව්ජි | O - ඇහැලේපොළ |
| P - විධුර | Q - පබ්ලික්හෝල් | R - මානාභරණ |

11. ලංකාවේ පැරණිතම ගැමි නාටකය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් වරණය තෝරන්න.

1. C H I  2. B I L  3. B F M  4. E L O  5. B C F  (........)

12. වෙස්මුහුණු නාටකවලට අදාළ පිළිතුර සහිත වරණය කුමක් ද?

1. A I O  2. F H M  3. D G M  4. K M J  5. C D I  (........)

13. නාඩගම් නාට්‍ය සම්ප්‍රදායට අදාළ පිළිතුර දක්වන්න.

1. A D H  2. E J M  3. F H N  4. E H P  5. A H O  (........)

14. නූර්ති නාට්‍ය සම්ප්‍රදායට අයත් වන්නේ,

1. A D K  2. C H R  3. D G K  4. C J K  5. E H Q  (........)

15. චාල්ස් ඩයස්ගේ නාට්‍ය ඇතුළත් වන්නේ කුමක් ද?

1. C H Q  2. E O Q  3. E P R  4. C N P  5. J K Q  (........)

16. ජෝන් ද සිල්වා ශූරීන්ගේ නාට්‍ය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් වරණය තෝරන්න.

1. F N Q  2. J N R  3. H K R  4. N R Q  5. C J Q  (........)

17. සන්නියකුම් යාගයෙහි කඩවත් තරණය නම් නාට්‍යමය ජවනිකාවේ භාවිත ප්‍රධානතම නාට්‍ය උපකරණය කුමක් ද?

1. කෙණ්ඩිය  2. කඩවත  3. දෙකොණ විලක්කුව

4. මුගුර  5. සන්නස් පත්‍රය  (........)

18. රටයකුමේ දී භාවිත තොරණ් හයකින් යුත් රංගභූමිය හඳුන්වනු ලබන්නේ,

1. වීදිය නමිනි  2. මල් මඬුව නමිනි  3. සබය නමිනි

4. යාග භූමිය නමිනි  5. සූනියම් වීදිය නමිනි  (........)

19. බෝවන රෝගවලින් ආරක්ෂාවීම හා එම රෝග පැතිරීම වැළැක්වීම සඳහා සත්පත්තිනි, වඳුරුමාල හා කුරුම්බර දේව සමූහයා උදෙසා සිදු කරන ශාන්තිකර්මය හඳුන්වන්නේ,

1. පූනා මඬුව ලෙසය.  2. ගම් මඩව ලෙසය.  3. ගී මඬුව ලෙසය.

4. පහන් මඬුව ලෙසය.  5. හැල්ලුම් මඬුව ලෙසය.  (........)

20. කෝළම් රංග භූමියෙහි නළුවන් වේෂ නිරූපණයෙහි යෙදෙන ස්ථානය හැඳින්වූයේ,

1. මඬුව නමිනි  2. මල්පැල නමිනි  3. තානායම්පොළ නමිනි

4. වෙස් අත්ත නමිනි  5. පියස්ස නමිනි  (........)

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා වරණ පහ බැගින් සපයා ඇත. ඒ අතරින් සෙසු පද හා නොගැළපෙන පදය තෝරා එහි අංකය වරහන තුළ යොදන්න.**

21. 1. ආරච්චි  2. මුදලි  3. ලෙංචිනා

4. ආඬිගුරු  5. තොංචි  (........)

22. 1. තෙරුක්කූත්තු  2. හරිශ්චන්ද්‍ර  3. බලිවාලා

4. පිලිප්පු සිංඤෝ  5. දෙමළ බෙරය  (........)

23. 1. ලංකා යක්ෂණී 2. රොඩී කෙල්ල 3. සීදේවි
4. ප්‍රතාප්සිං 5. උමතු විශ්වාසය (........)

24. 1. කොටළුවා 2. විජයතසම් 3. ජෙසලම්පුරය
4. කයාපාස් 5. ඔබේරඅමගවු (........)

25. 1. වෙල්ල කට්ටර 2. මන්මදන් 3. මාරි අම්මාන්
4. විදූෂක 5. තිරුවිලා (........)

26. නාටක අරංකන් කල්ලූරි ආයතනය පිහිටුවීමට මූලිකව කටයුතු කරන ලද්දේ,
1. එම්. ෂංමුගලිංගම් 2. එස්. මෞනගුරු 3. එස්. විද්‍යානන්දන්
4. වොර්ණ ලිංගම් 5. කේ. කණපතිපිල්ලේ (........)

27. ජෙරොම් ද සිල්වා විසින් රංග වින්‍යාසය නිර්මාණය කළ නාට්‍ය යුගලය කුමක් ද?
1. ආයෙත් එන්නේ නෑ - මානස විල 2. මැක්බත් - ද ලයන් කිං
3. ට්‍රෝජන් කාන්තාවෝ - මානස විල 4. චෙක්පොයින්ට් - හැම්ලට්
5. වෙළෙන්දාගේ මරණය - මැක්බත් (........)

28. බර්ටෝල් බ්‍රෙෂ්ට්ගේ ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් කෘතිය ආශ්‍රයෙන්, ස්ටැනිස් ලව්ස්කිගේ රංග රීතිය අනුගමනය කොට ගුණසේන ගලප්පත්ති විසින් නිෂ්පාදිත නාට්‍ය වනුයේ,
1. සඳ කිඳුරු 2. දෑස නිසා 3. ලියතඹරා
4. තාත්තා 5. දේවතා එළි (........)

29. නාටකයක ලක්ෂණයක් ලෙසගත හැක්කේ,
1. කතා වස්තුව කවියාගේම නිර්මාණයක් වීම.
2. වස්තුව ප්‍රඛ්‍යාත වීම.
3. මධ්‍යම පාංතික හෝ ඊට පහත් සමාජ සිදුවීම් පාදක කොට ගැනීම.
4. නායක චරිතය ධීර ප්‍රශාන්ත ගණයට අයත්වීම.
5. අශ්වඝෝෂගේ, ශාරිපුත්‍ර ප්‍රකරණය නාටක ගණයට අයත්වීම. (........)

30. සංස්කෘත නාට්‍ය වස්තුවේ අර්බුදකාරී / අවස්ථාව හඳුන්වනු කෙසේද?
1. ප්‍රාරම්භ 2. යත්න 3. ප්‍රාප්ත්‍යාශ්‍යා
4. නියතාප්ති 5. ඵලාගම (........)

31. නෝ (NOH) නාට්‍ය කලාවේ ක්යෝ (KYO) ලෙස හඳුන්වන්නේ,
1. දෙවියා ය. 2. උමතු බව ය. 3. මිනිසා ය.
4. යක්ෂ ය. 5. ස්ත්‍රිය ය. (........)

32. ප්‍රධාන වීරයා දෙවියකු හෝ දෙවඟනක ලෙස නිරූපිත නෝ (NOH) නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
1. සුර නෝ 2. කශුර නෝ 3. කුරුයි නෝ
4. වකි නෝ 5. කිරි නෝ (........)


- **පහතින් සපයා ඇති ශිල්පීන්/ශිල්පිණියන්ගේ ඡායාරූප ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**


A


B


C


D


E

33. සිංහල වේදිකාවෙන් එතෙක් පැවති ඒකාකාරී බව මඟහැර ස්වභාවික නාට්‍ය සම්ප්‍රදායට අනුගතව නාට්‍ය නිර්මාණය කිරීමේ පුරෝගාමියා කවුද?

1. A 2. B 3. C 4. D 5. E (........)

34. නූතන ඉංග්‍රීසි නාට්‍ය වේදිකාවේ අන්තර්ජාතික තලයට යමින්, පර්යේෂණාත්මක නාට්‍ය කලාවකට අවතීර්ණ වී සිටින නාට්‍ය වේදියා / වේදිනිය කවුරුන් ද?

1. A 2. B 3. C 4. D 5. E (........)

35. ඔපෙරා ශෛලියෙන් නාට්‍ය නිෂ්පාදනය කිරීම ලංකාවට හඳුන්වා දුන් ශිල්පියකු/ශිල්පිණියක වන්නේ,

1. A 2. B 3. C 4. D 5. E (........)

36. වාර්තා රංගය ප්‍රථම වරට දේශීය වේදිකාවට හඳුන්වාදුන් ශිල්පියා/ශිල්පිණිය වන්නේ කවුද?

1. A 2. B 3. C 4. D 5. E (........)

37. දේශපාලන තේමා සහිත නාට්‍ය මෙන්ම ලාංකීය වේදිකාවේ ප්‍රථම වරට වැඩ වර්ජනයක් වේදිකාගත කළ නාට්‍ය ශිල්පියා/ශිල්පිණිය වන්නේ කවුරුන්ද?

1. A 2. B 3. C 4. D 5. E (........)

38. "(සිනාසෙමින්) පපුව පුම්බවන තමන්ගේ තරුණ වයසට දොස් කියන්ඩ. මට මොකටද නිකං දොස් පවරන්නේ? "

ශාකුන්තලයේ එන ඉහත ප්‍රකාශය කියන ලද්දේ කවුරුන් විසින් ද?

1. අනසූයා 2. ප්‍රියංවදා 3. මේනකා
4. ශකුන්තලා 5. දුෂ්‍යන්ත (........)

39. කුවේණි නාට්‍ය පෙළ රචනය සඳහා පාදකොට ගත් කෘතීන් ඇතුළත් වර්ණය තෝරන්න.

1. මහා වංශය, රාජාවලිය, කුවේණි අස්න
2. මහා භාරතය, කුවේණි අස්න, සිංහල ගැමි නාටකය
3. රාමායණය, මීඩියා, කුවේණි අස්න
4. කුවේණි අස්න, මහා භාරතය, සියබස් මල්දම
5. රාමායණය, කුවේණි අස්න, විශ්ණු පුරාණය (........)

40. නාට්‍ය විචාරය යනු,

1. නාට්‍යයේ දුබලතා පෙන්වා දීමයි.
2. නාට්‍යයේ සාධනීය ලක්ෂණ ඉදිරිපත් කිරීමයි.
3. නාට්‍යයේ ගුණාත්මක බව සාකච්ඡා කිරීමයි.
4. නාට්‍ය නිර්මාණය විශ්ලේෂණාත්මකව විග්‍රහ කිරිමයි.
5. නාට්‍ය විවේචනය කිරීමයි. (........)

## II කොටස

- A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

01. i. නාට්‍ය කලාව හැර ප්‍රාසංගික කලා ගණයෙහිලා සැලකිය හැකි වෙනත් කලා ප්‍රභේද හතරක් නම් කරන්න. (ලකුණු 4)
    ii. ඉහත i හි ඔබ නම් කළ කලාංගයන් අතුරින් ප්‍රභේද දෙකක් ප්‍රාසංගික කලා ලෙස උදාහරණ සහිතව කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)
    iii. නාට්‍ය කලාව ප්‍රාසංගික කලා ප්‍රභේද අතර සුවිශේෂ වීමට බලපාන හේතු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 6)

02. i. නාට්‍ය ශාස්ත්‍රයේ එන රූපක ප්‍රභේද හතරක් නම් කරන්න. (ලකුණු 4)
    ii. ඉහත i හි දැක්වූ ප්‍රභේද අතුරින් එක් ප්‍රභේදයක ලක්ෂණ පහක් දක්වන්න. (ලකුණු 5)
    iii. අභිඥාන ශාකුන්තලය අයත් රූපක ප්‍රභේදය නම් කොට එම ප්‍රභේදයේ ලක්ෂණ නාට්‍ය පෙළ ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

03. i. කුවේණි චරිතය තුළින් නාට්‍යකරු මතු කිරීමට උත්සහ ගන්නා උතුම් මානුෂීය ගුණාංග තුනක් නම් කරන්න. (ලකුණු 4)
    ii. කුවේණි අස්නෙහි ඇති මූලාශ්‍ර දෘෂ්ටියට වඩා නාට්‍යකරුගේ දෘෂ්ටියෙහි ඇති සුවිශේෂිතාව කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)
    iii. "ලොවපුරා සැරිසරන්නේ විජය සහ කුවේණිලාය. ඔවුන් සොයන්නේ සෙනෙහස හා රැකවරණයයි." නාට්‍ය ඇසුරින් විමසන්න. (ලකුණු 6)

### B කොටස

04. i. කබුකි නාට්‍යයේ ආරම්භය සිදු වූ අයුරු කෙටියෙන් දක්වන්න. (ලකුණු 4)
    ii. කබුකි වේදිකාවේ කොටස් හඳුන්වා දෙන්න. (ලකුණු 5)
    iii. කබුකි රංග ශෛලිය පැහැදිලි කරන්න. (ලකුණු 6)

05. i. මනමේ නාට්‍ය වේදිකාගතවීමත් සමඟ නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය සඳහා නාට්‍යකරුවන් භාවිත කළ විශේෂ ක්‍රමවේද අතුරින් විශේෂතා හතරක් දක්වන්න. (ලකුණු 2)
    ii. "වේදිකා නාට්‍ය පොදු ජනතාව අතරට ගෙනයාමේ විශාල කාර්යභාරයක් ඉටු කිරීමට 1974 වේදිකාගත කළ සුභ සහ යස නාට්‍ය දායක විය." කෙටියෙන් කරුණු දක්වන්න. (ලකුණු 5)
    iii. නූතන වේදිකා නාට්‍යයන්හි දක්නට ලැබෙන සාධනීය හා නිශේධනීය ලක්ෂණ නූතන නාට්‍ය උදාහරණ ලෙස ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 6)

06. i. ලංකාවේ නූර්ති නාට්‍ය සම්ප්‍රදායේ ආරම්භය කෙටියෙන් දක්වන්න. (ලකුණු 2)
    ii. ටීටර් හා මිනර්වා නාට්‍යවල ලක්ෂණ හතර බැගින් වෙන් වෙන්ව ලියන්න. (ලකුණු 5)
    iii. නූර්ති නාට්‍ය කලාවේ සුවිශේෂ ලක්ෂණ සඳහන් කර දේශීය නාට්‍ය කලාවේ පෝෂණයට එමගින් සිදු වූ මෙහෙය අගයන්න. (ලකුණු 6)

* *

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்களம் - வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 03 යි |
|---|---|---|

අමතර කියවීම් කාලය - මි. 10 යි

# නාට්‍ය හා රංග කලාව - II

57 S II

ඇතුළත්වීමේ අංකය :- ..........................................................................................

උපදෙස් :

I කොටස - සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

II කොටස - A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

01. ප්‍රාකෘතික කලාවට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න,
   1. මටසිලිටි බවින් යුක්තය.
   2. ප්‍රේක්ෂක විඥානය පුළුල් කරයි.
   3. ලාලිත්‍යයෙන් හා සුබනම්‍ය බවින් යුක්තය.
   4. මිනිස් චෛතසිකය සමඟ ආත්මීය වේ.
   5. අභිචාරාත්මක අරුතින් යුක්තය. (........)

02. රංග පරම සංගීතය සඳහා අදාළ නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක්ද?
   1. නාට්‍යයේ බාහිර ආටෝපය රඳවා ගනියි.
   2. යටිපෙළ අරුත් මතු කරන සංගීතයයි.
   3. මතුපිට අරුත් තීව්‍ර කරයි.
   4. රංගනය අභිබවා ඉස්මතු වේ.
   5. පසුබිම් සංගීතය හා සමාන වේ. (........)

03. අභිනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. ස්ථම්භ, ප්‍රලය, රෝමාංච ආදිය සාත්වික භාවයන්ය.
   2. භරතමුණි සිය කාව්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයේ අභිනය විස්තර කොට තිබේ.
   3. චාරී, හස්ත, අංග, ශීර්ෂ ලෙස ආංගික අභිනයේ ප්‍රභේද හතරකි.
   4. අභිනය විධි හතරම පාත්‍රයා සිය ශරීරය භාවිතයෙන් ප්‍රදර්ශනය කරයි.
   5. නළුවා සතර අභිනය භාවිත කරන ආකාරය අනුව එම නාට්‍ය ශෛලිය පැවසිය නොහැක. (........)

04. රංගාලෝකය සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය කුමක්ද?
   1. ග්‍රීක හා රෝම නාට්‍ය රඟ දැක්වීම සඳහා විශේෂ වූ ආලෝකයක් අවශ්‍ය නොවිය.
   2. පෙරදිග නාට්‍ය කලාවේ මුල් අවදියේ අඳුර පලවාහැරීම අරමුණු කොටගෙන පන්දම් හා පහන් වර්ග භාවිත විය.
   3. මධ්‍ය කාලීන යුරෝපීය ජන වන්දනා නාට්‍ය දේවස්ථාන ඇතුළත ප්‍රදර්ශනය කළ නිසා ආලෝකය අවශ්‍ය විය.
   4. 16 වන සියවසේ නව රංගශාලා ආරම්භ වීමත් සමඟ ආලෝක ප්‍රභවයක අවශ්‍යතාව මතුවිය.
   5. 1917 න් පසුව වේදිකාවේ ගෑස් ලාම්පු භාවිතය ඇරඹිණි. (........)

05. ප්‍රාසංගික කලා ප්‍රභේද අතර වේදිකා නාට්‍ය කලාව සතුව පමණක් ඇති ගුණාංගයක් ලෙස සැලකෙන්නේ,
1. සජීවී බව  ය.
2. ප්‍රේක්ෂක ප්‍රතිචාර ඒ මොහොතේම ලැබීම ය.
3. නිශ්චිත හෝ තාවකාලික රංග භූමියක් යොදා ගැනීම ය.
4. මනා ප්‍රාසංගිකත්වයකින් යුක්ත වීම ය.
5. පරායත්ත කලාවක් වීම ය. (........)

06. අනුකරණය සම්බන්ධයෙන් ඇරිස්ටෝටල්ගේ මතයට අනුව නිවැරදි පිළිතුර කුමක් ද?
1. ශෝකෝත්පාදකයේ දී ප්‍රකෘති ස්වභාවයට වඩා පහත් මිනිසුන් අනුකරණය කෙරේ.
2. හාස්‍යෝත්පාදකයේ දී ප්‍රකෘති ස්වභාවයට වඩා හොඳ මිනිසුන් අනුකරණය කෙරේ.
3. ශෝකෝත්පාදකය යනු උත්තුංග ක්‍රියාවක අනුකරණයකි.
4. කවියකු සතු අනුකරණ මාධ්‍ය විධි 5 කි.
5. අනුකරණය සම්බන්ධයෙන් කාව්‍ය ශාස්ත්‍රයේ සඳහන් නොවේ. (........)

07. රංගභූමි සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,
1. මධ්‍ය කාලීන යුගයේ ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව බිහි විය.
2. මධ්‍ය කාලීන රංගශාලා අතර කොලෝසියමට ප්‍රමුඛස්ථානයක් හිමිය.
3. ග්‍රීසියේ දියෝනීසස් රඟහල කේවියා, ස්කීන්ෆ්‍රොන්ස් නම් මණ්ඩපයන්ගෙන් සමන්විතය.
4. රෝම රඟ මඩලෙහි වේදිකා ගෘහය අතිශය විසිතුරු කේවල මණ්ඩපයකින් සමන්විතය.
5. එලිසබතීන යුගයේ ග්ලෝබ් වේදිකාවේ ප්‍රධාන ලක්ෂණ ලෙස ප්‍රේක්ෂාලය, ඕර්කෙස්ට්‍රාව, වේදිකා ගෘහය දැක්විය හැක. (........)

08. රංග ශෛලීන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කවරක්ද?
1. නාට්‍ය ධර්මී යනු පෙරදිග මෙන්ම අපරදිග ද ඇති වූ මතවාදයකි.
2. සංස්කෘත නාට්‍යක ප්‍රකාශ භාෂණ හා රහස් දෙඩීම් වැනි මූලික සංවාද තාත්විකව ඉදිරිපත් කෙරිණි.
3. අපවාරිත හා ජනාන්තික භාෂණ ක්‍රම ලෝකධර්මී වේ.
4. නාට්‍ය ශාස්ත්‍රයේ ලෝකධර්මී සම්ප්‍රදාය පිළිබඳ සඳහන් නොවේ.
5. නාට්‍යධර්මී සම්ප්‍රදායේ දී සෑම විටම වස්තුකර ගනුයේ කාලීන කතා පුවතකි. (........)

09. රූපණය සම්බන්ධයෙන් නිවැරදි **නොවන** ප්‍රකාශය තෝරන්න.
1. ස්ටැනිස් ලව්ස්කි "නළුවකුගේ පෙරහුරුව" ග්‍රන්ථයේ රූපණය පිළිබඳ අදහස් දක්වා තිබේ.
2. පෙරදිග නාට්‍ය කලාවේ මූලික අරමුණ වන්නේ, පරිශීලනය කරන්නාට රසයක් ලබා දීමයි.
3. බර්ටෝල් බ්‍රෙෂ්ට් සිය ආඛ්‍යාන රංගයේ දී නළුවාගේ අවේශය පිටු දකියි.
4. චීනය, ජපානය ආදී රටවල කුඩා කළ සිටම නළු කලාවක් ලෙස රූපණය ප්‍රගුණ කරයි.
5. කබුකි නාට්‍යයේ දී නළුවා රූපණයෙන් අගතැන්පත් වීම කුසුම අත්පත් කර ගැනීම (මොනමොනෝ) ලෙස හැඳින්වේ.

(........)

- **ප්‍රශ්න අංක 10 සිට 13 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු ගොනුව ආශ්‍රයෙන් නිවැරදි පිළිතුරු සහිත අක්ෂර කාණ්ඩ හිස්තැන මත ලියන්න.**

| | | | |
|---|---|---|---|
| A - තෝමස් කීඩ් | B - උමං දොරටු | C - මේ කීස් | D - බූත් |
| E - උපරි වේදිකාව | F - ස්කිනි | G - රොබට් ග්‍රීන් | H - ජංගම රථ |
| I - ඕර්කෙස්ට්‍රා | J - ජෝන් ලයිලි | K - ස්වර්ගය | L - බහුවේදිකා |
| M - බෙන් ජොන්සන් | N - මන්දිර වේදිකා | O - අධ්‍යයනාගාරය | P - පැරිස්කීනියා |

10. ශේක්ස්පියර්ගේ සමකාලීන නාට්‍ය කරුවන්ය. (..........................................)
11. ප්‍රක්ශේෂිත රංග ශාලාව (ග්ලෝබ් රඟහල) හා සම්බන්ධ වේ. (..........................................)
12. ග්‍රීක රඟහලේ කොටස්ය. (..........................................)
13. මධ්‍ය කාලීන ශ්‍රේණි නාටකවල දී යොදාගත් වේදිකාවන්ය. (..........................................)

- **ප්‍රශ්න අංක 14 සිට 19 දක්වා සපයා ඇති වරණ අතරින් එකක් නොගැළපේ. එම නොගැළපෙන වරණය සහිත අංකය වරහන තුළ යොදන්න.**

14. 1. ටෙරේසියාස් 2. යොකෙස්ට්‍රා 3. හීමන්
4. ඊඩිපස් 5. තීබ ගොපල්ලා (........)

15. 1. හිපොලිටස් 2. බොයිෆොරොයි 3. මීඩියා
4. බැකීවරු 5. ට්‍රොජන් විමෙන් (........)

16. 1. ටර්ටූලියන් 2. අඳුරු යුගය 3. ද මිස්ටරි ඔෆ්-ඇඩම්
4. හ්‍යුබ්‍රිස් 5. ආදම් (........)

17. 1. ශ්‍රීමත් පිලිප් සිඩ්නි 2. ක්‍රිස්ටෝෆර් මාර්ලෝ 3. රොබට් ග්‍රීන්
4. විලියම් ශේක්ස්පියර් 5. අර්වින් පිස්කටෝර් (........)

18. 1. බර්නාඩ් ෂෝ 2. ස්ට්‍රිං බර්ග් 3. එඩ්වඩ් ඕල්බි
4. ආතර් මිලර් 5. ගාර්ෂියා ලෝකා (........)

19. 1. අ මිඩ් සමර් නයිට් ඩ්‍රීම්ස් 2. රෝමියෝ ජුලියට් 3. ජුලියස් සීසර්
4. කිං ලියර් 5. හැම්ලට් (........)

- **පහත සංවාද කොටස් ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 20 සිට 24 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

Q – ඔබලාට පිස්සුද? හිස් අවුල්කරගත් මිනිස්සු ලැජ්ජා නැද්ද නුඹලාට බැණ අඬගහ ගන්න මේ හැමදෙනා ඉදිරියේ. රට මෙහේ මහා විපැත්තියක.

R – කැසියස් මාලඟ නැති විදියේ යහ ගුණයක් ඇදලා අරගෙන ඔබ මාව මොන අනතුරකට තල්ලු කරන්නද හදන්නේ?

S – හැම තිස්සෙම හදන්නේ අපි දෙන්නා ගජයාළුවෝ කියන බව අනිත් අයට මහ ඉහළින් ඉස්මතු කරලා පෙන්වන්න.

T – මගෙ හිතවත්කම නෝන්ජල්කමක් විදියට ගන්න එපා. පස්සේ කණගාටු වෙන දෙයක් මගෙ අතින් වෙන්නත් පුළුවං.

U – සිංහ ධේනුවක් පැටව් වදලා තිබුණ ලු මහ පාර මැද. මිනී වළවල කට ඇරිලා මළමිනී එළියට ආවලු.

20. Q අක්ෂරයෙන් දැක්වෙන සංවාදය ඊඩිපස් නාට්‍යයේ කවුරුන් විසින් ප්‍රකාශ කරන ලද්දක්ද?
1. ක්‍රෙයෝන් 2. ජොකෙස්ට්‍රා බිසව 3. ඊඩිපස්
4. ටෙරේසියාස් 5. අත්වැල (........)

21. R අක්ෂරයෙන් දැක්වෙන සංවාදය ප්‍රකාශ කරන ලද්දේ,
1. මාක් ඇන්ටනි විසිනි 2. සීසර් විසිනි 3. කැසියස් විසිනි
4. බ්‍රැටස් විසිනි 5. ඔක්ටේවියස් විසිනි (........)

22. S අක්ෂරයෙන් දැක්වෙන සංවාදයෙන් විස්තර වන්නේ කවුරුන් පිළිබඳව ද?
1. ක්‍රොග්ස්ටාඩ් පිළිබඳ 2. දොස්තර රන්ක් පිළිබඳ
3. ලින්ඩේ මහත්මිය පිළිබඳ 4. හෙල්මර් පිළිබඳ
5. නූවුරා පිළිබඳ (........)

23. T අක්ෂරයේ එන සංවාදය ප්‍රකාශ කරන ලද්දේ,
1. බ්‍රෑටස් විසිනි 2. කස්කා විසිනි 3. පෝර්ෂියා විසිනි
4. මාර්ක් ඇන්ටනී විසිනි 5. කැසියස් විසිනි (........)

24. U අක්ෂරයෙන් දැක්වෙන ආකාරයට, මුරකරුවකු විසින් දුටු සිහිනය සීසර් දැනගන්නේ කවුරුන් හරහාද?
1. පෝර්ෂියා හරහා 2. කැල්ෆර්නියා හරහා 3. මාක් ඇන්ටනී හරහා
4. ඔක්ටේවියස් හරහා 5. කැසියස් හරහා ය. (........)

25. ඊඩිපස් නාට්‍යයේ කොරින්තියානු පණිවුඩකරුවා පැමිණෙන්නේ,
1. දෙවන අංකයේ ය. 2. නාට්‍ය ආරම්භයට පෙරය 3. තෙවන අංකයේ ය.
4. පළමු අංකයේ ය 5. සිව්වන අංකයේ ය. (........)

26. ස්වින්බර්ග් විසින් "මිනිසා විසින් නිමවන ලද උත්තරීතර අධ්‍යාත්මික කෘතිය" ලෙස හඳුන්වා ඇත්තේ,
1. ඔරෙස්ට්‍රියා නාට්‍ය ත්‍රිතකය 2. ඊඩිපස් නාට්‍ය ත්‍රිතකය 3. මීඩියා නාට්‍යය
4. වළාකුළු නාට්‍යය 5. ඇන්ටිගනී නාට්‍යය (........)

27. මධ්‍ය කාලීන ජන වන්දනා නාට්‍යයන්හිදී පුරාණ ගිවිසුමට අයත් පල්ලිය ඉදිරිපිට රඟ දක්වන ලද මිස්ටරි නාට්‍යයක් වනුයේ,
1. කායින් සහ ආබෙල් පුවත 2. අන්තිම රාත්‍රී භෝජනය
3. දෙවන එඬේරාගේ කතාව 4. තහනම් ගසේ ගෙඩි කෑම
5. ආබ්‍රහම් සහ ඊසාක්ගේ කතාව (........)

28. එලිසබතීන යුගයේ එතෙක් පැවති සම්මත රීතීන්ගෙන් බැහැරව, මාත්‍රා දහයකින් යුක්ත පද්‍ය විශේෂය භාවිත කිරීමේ පුරෝගාමියා වන්නේ,
1. බෙන් ජොන්සන් 2. ජෝන් ලයිලි 3. විලියම් ශේක්ස්පියර්
4. රොබට් ග්‍රීන් 5. ක්‍රිස්ටෝෆර් මාර්ලෝ (........)

29. ප්‍රකාශනවාදී රීතියෙන් නාට්‍ය නිර්මාණය කිරීමේ පුරෝගාමී නාට්‍යකරුවෙකි.
1. ඔගස්ට් ස්ට්‍රින්බර්ග් 2. වෝල්ටර් හෙසන්ක්ලෙවර් 3. අන්ද්‍රෙ අන්කොයින්
4. අර්වින් පිස්කටෝර් 5. ආතර් ඇඩමෝව් (........)

30. ධනාත්මක විචාර කලාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
1. නිශ්චිත රාමුවක් ඔස්සේ විචාරය කිරීම.
2. එක් එක් නාට්‍ය පිළිබඳ පූර්ව නිශ්චිත දෘෂ්ටි කෝණයකින් විචාරය කිරීම.
3. එක් එක් නාට්‍යයට අදාළව විචාර සිද්ධාන්ත ගොඩනගමින් විචාරය කිරීම.
4. නාට්‍ය පෙළෙහි නිර්මාණාත්මක වටිනාකම් පිළිබඳ අනවබෝධයෙන් යුතුව විචාරය කිරීම.
5. නාට්‍ය කලාව පිළිබඳව සංවෘත මනසකින් විචාරය කිරීම. (........)

31. නාට්‍යයේ මැදට වෘන්ද ගීත හතරක් යොදා, කොටස් පහකට බෙදා ශෝකාන්ත ලක්ෂණ සහිතව නිර්මාණය වී ඇති සැටර් නාට්‍යයක් වන්නේ,
1. ඉක්නෙව්ටායි 2. ෆිලොක්ටටීස් 3. ද බැකී
4. කුක්ලොප්ස් 5. ප්ලූටස් (........)

32. ග්‍රීක වේදිකාව සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය මින් කුමක් ද?
1. අවශ්‍ය ස්ථානයට නළුවා ඔසවාගෙන යාහැකි පරිදි දොඹකර භාවිත විය.
2. ග්‍රීක වේදිකාවේ භීෂණ ක්‍රියාවන් සිදු නොකෙරෙයි.
3. දෙව්ලොව දර්ශන පෙන්වීම සඳහා පැරිස්කීනියා භාවිත විය.
4. නේපත්‍ය ගෘහයේ වහළය ද රඟපෑම සඳහා යොදාගෙන තිබේ.
5. ග්‍රීක වේදිකාවේ තිරයක් භාවිත නොවුනි. (........)

33. රූකඩ ගෙදර නාට්‍යයේ දෙවන අංකයේ සිදුවන ප්‍රධාන සිදුවීමකි.
   1. ණය ගනුදෙනුව ඇතුළත් ලිපිය ක්‍රොග්ස්ටඩ් විසින් හෙල්මර්ගේ ලියුම් පෙට්ටියට දැමීම.
   2. තමා ණය ලබා ගත් පුද්ගලයා කවුරුන්දැයි නෝරා, ලින්ඩේට නොපැවසීම.
   3. ලින්ඩේ හා ක්‍රොග්ස්ටඩ් ප්‍රේමයෙන් පසු වූ බව හෙළිවීම.
   4. ක්‍රොග්ස්ටඩ් බැංකුවේ දී හොර අත්සන් යොදා වංචා කර ඇති බව හෙල්මර් නෝරාට පැවසීම.
   5. නෝරා ණය ලබාගෙන ඇත්තේ ක්‍රොග්ස්ටඩ්ගෙන් බව ප්‍රේක්ෂකයා පළමුවරට දැන ගැනීම. (........)

34. " මම බොහොමයක් වෙලාවට ප්‍රාර්ථනා කෙරුවා ඔයාට ලොකු විත්තැහියක් වෙනවනම් හොඳයි කියලා. එහෙම නම් ඔයා වෙනුවෙන් මගේ ලේ, ජීවිතය, ඇතුළු මුළු ආත්මෙම කැප කරන්න මට අවස්ථාවක් ලැබෙනවා. "
   රූකඩ ගෙදර නාට්‍යයේ ඉහත ප්‍රකාශය කරන ලද්දේ,
   1. දොස්තර රන්ක් විසිනි
   2. හෙල්මර් විසිනි
   3. නුවුරා විසිනි
   4. ලින්ඩෙ විසිනි
   5. ක්‍රොග්ස්ටඩ් විසිනි (........)

35. " වාචාලයෝ, ස්තුති කරගනින් තමන්ටම. මං කියපු විදියට එදාම මුගේ දිව කපා දැම්මනං අද මෙහෙම අහන්න වෙන්නෙ නෑනෙ "
   ජුලියස් සීසර් නාට්‍යයේ ඉහත ප්‍රකාශයෙන් කියවෙන්නේ කවුරුන් පිළිබඳව ද?
   1. බ්‍රූටස් පිළිබඳව
   2. සීසර් පිළිබඳව
   3. කස්කා පිළිබඳව
   4. කැසියස් පිළිබඳව
   5. මාක් ඇන්ටනී පිළිබඳව (........)

36. " රූපණය " යන්න නිවැරදිව අර්ථ දක්වා ඇති වරණය වන්නේ,
   1. යම් පුද්ගලයෙකු විසින් සිදු කළ දෙයක් ඒ ආකාරයෙන්ම සිදු කිරීමයි.
   2. රංගනයේදී නළු නිළියන් විසින් භාවිත කරන ශිල්ප ක්‍රමය.
   3. යම් චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත් වීමයි.
   4. තමාගේ භව්‍ය ස්වරූපය අමතකකොට කෙටි කාලීනව වෙනත් පුද්ගලයකු බවට පත්වීමයි.
   5. ඉදිරියට පැමිණවීම යන අර්ථය ගෙනේ. (........)

37. ඇරිස්ටෝටල් විසින් "වේදිකාවේ දෘෂ්ටි ගෝචර භාවය" ලෙස හඳුන්වන ලද්දේ,
   1. රංග වින්‍යාස යි.
   2. ප්‍රේක්ෂාවයි
   3. රංගාලෝකය යි.
   4. රංග භූමි තාක්ෂණය යි.
   5. අංග රචනය යි. (........)

38. නාට්‍යයේ කලාත්මක පක්ෂය සම්බන්ධ සියළු වගකීම් දරනු ලබන්නේ,
   1. අධ්‍යක්ෂවරයාය.
   2. වේදිකා පාලකවරයා ය.
   3. අංග රචනා ශිල්පියාය.
   4. නළු-නිළියන්ය.
   5. රංගභූමි අලංකරණ ශිල්පියාය. (........)

39. යන්ත්‍ර-සූත්‍රවලින් භාණ්ඩ නිපදවීමේ දී ඒවායේ හැඩ සහ වර්ණය ආදියට කලාත්මක ලක්ෂණ එකතු කිරීමෙන් භාණ්ඩ ජනප්‍රිය කරවීම හා වෙළඳපොළ ඉල්ලුම වැඩි කර ගැනීම සඳහා භාවිත කරන කලාව වනුයේ,
   1. ලලිත කලාවයි.
   2. ජනප්‍රිය කලාවයි.
   3. ප්‍රකෘතික කලාවයි.
   4. ව්‍යවහාරික කලාවයි.
   5. ප්‍රාසංගික කලාවයි. (........)

40. යුරෝපය තුළ යථාර්ථවාදී නාට්‍ය කලාව බිහිවීමට බලපෑ හේතුවක් **නොවූයේ**,
   1. වැඩවසම් සමාජ ක්‍රමය වෙනුවට මධ්‍යම පංතිය බිහිවීම ය.
   2. සමානාත්මතාව, යුක්තිය හා සාධාරණත්වය මතුවීම ය.
   3. පරිණාම වාදය, හේතුඵල වාදය වැනි සිද්ධාන්ත බිහිවීම ය.
   4. කාන්තා විමුක්තිය හා නිදහස හිමිව තිබීම ය.
   5. මුදල කේන්ද්‍ර කොටගත් ආර්ථිකයක් බිහිවීම ය. (........)

## II කොටස

- A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### A කොටස

01. i. කතා වින්‍යාසය කරුණු තුනකින් සමන්විත විය යුතු බව දක්වෙන්නේ කාව්‍යශාස්ත්‍රයේ කී වන පරිච්ඡේදයේ දැයි දක්වා එම කරුණු තුන නම් කරන්න. (ලකුණු 4)

ii. සොෆොක්ලීස් විසින් ඊඩිපස් රජ නාට්‍යය තුළ භාව විශෝධනය (කැතාර්සිස්) ඇති කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග නාට්‍ය පෙළ ඇසුරින් කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)

iii. "ඛේදාත්ම වීරයා (Tragic Hero) නාට්‍යය අවසන ඛේදය කරා ගමන් කළද ඔහු පිටව යන්නේ ප්‍රඥාව අත්පත් කොටගෙනය" ඊඩිපස් රජ නාට්‍ය ඇසුරින් විමසන්න. (ලකුණු 6)

02. i. ක්‍රි.පූ. 60 දී රෝමය පාලනය කළ ත්‍රිත්ව පුද්ගල පාලන අධිකාරිය නම් කරන්න. (ලකුණු 4)

ii. එළිසබතීන යුගයේ නාට්‍ය කලාවේ සුවිශේෂ ලක්ෂණ ජුලියස් සීසර් නාට්‍ය පෙළ ඇසුරින් කෙටියෙන් විමසන්න. (ලකුණු 5)

iii. "අතීතය නැවත නැවත ද සිදුවිය හැක. නූතන දේශපාලන බල අරගලයේ යථා ස්වරූපය ජුලියස් සීසර් නාට්‍ය තුළින් මනාව නිරූපණය වේ." නාට්‍ය පෙළ ඇසුරින් විමසන්න. (ලකුණු 6)

03. i. මධ්‍ය කාලීන ජන වන්දනා නාට්‍ය රඟ දැක්වූ වේදිකා වර්ග නම් කරන්න. (ලකුණු 4)

ii. පල්ලිය ඇතුළත රඟ දැක්වූ ජන වන්දනා නාට්‍යයන් හි ආනුෂංගික කලා භාවිත වූ ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 5)

iii. "මොරැලිටි නාට්‍ය හරහා බයිබලීය හා ආගමික කතා පුවත් වලින් බැහැරව, පොදු මිනිස් සදාචාරය පිළිබඳ සාකච්ඡා කරන නාට්‍ය කලාවක් බිහිවිය" උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 6)

### B කොටස

04. i. යථාර්ථවාදී රීතිය අනුගමනය කළ නාට්‍යකරුවන් සිව්දෙනෙකු නම් කරන්න. (ලකුණු 4)

ii. රූකඩ ගෙදර නාට්‍යයේ අන්තර්ගත තේමා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

iii. රූකඩ ගෙදර නාට්‍යයේ පශ්වාද් දෘෂ්ටිකථන රීතිය භාවිත කර ඇති ආකාරය නාට්‍ය පෙළ ඇසුරින් විමසන්න. (ලකුණු 6)

05. i. ප්‍රාසංගික නොවන කලා ප්‍රභේද හතරක් නම් කරන්න. (ලකුණු 4)

ii. ඉහත i. හි ඔබ නම් කළ කලා ප්‍රභේද ප්‍රාසංගික කලා ගණයෙහිලා නොසැලකීමට හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 5)

iii. නාට්‍ය කලාවේ අභිවෘද්ධිය සඳහා ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර සහ සහභාගීත්වය කොතෙක්දුරට දායක වන්නේදැයි උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 6)

06. i. රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා දෙක බැගින් නම් කරන්න. (ලකුණු 4)

ii. රංග අභ්‍යාස හා රංග ක්‍රීඩා හරහා නළුවා වර්ධනය කර ගන්නා ගුණාංග තුන බැගින් වෙන් වෙන් වශයෙන් ලියන්න. (ලකුණු 5)

iii. ඔබ නාට්‍ය හා රංගකලා විෂය හදාරණ ශිෂ්‍යයකු හෝ ශිෂ්‍යාවක වශයෙන් එම විෂයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදීමේදී රංග අභ්‍යාස හා රංග ක්‍රීඩාවල යෙදීම කොතෙක් දුරට ඒ සඳහා උපස්ථම්භක වූ වේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 6)

* * *

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

නාට්‍ය හා රංග කලාව - I

| 57 | S | I |
|---|---|---|

## පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1 - 4 | 11 - 2 | 21 - 4 | 31 - 2 |
| 2 - 2 | 12 - 3 | 22 - 3 | 32 - 4 |
| 3 - 3 | 13 - 5 | 23 - 5 | 33 - 5 |
| 4 - 5 | 14 - 4 | 24 - 2 | 34 - 2 |
| 5 - 1 | 15 - 3 | 25 - 4 | 35 - 4 |
| 6 - 2 | 16 - 1 | 26 - 1 | 36 - 1 |
| 7 - 3 | 17 - 5 | 27 - 3 | 37 - 3 |
| 8 - 4 | 18 - 2 | 28 - 5 | 38 - 2 |
| 9 - 5 | 19 - 4 | 29 - 2 | 39 - 1 |
| 10 - 1 | 20 - 1 | 30 - 3 | 40 - 4 |



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

නාට්‍ය හා රංග කලාව - II

| 57 | S | II |
|---|---|---|

**පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| 1 - 5 | 11 - B E K O | 21 - 4 | 31 - 2 |
| 2 - 2 | 12 - C F I P | 22 - 1 | 32 - 3 |
| 3 - 1 | 13 - D H L N | 23 - 5 | 33 - 1 |
| 4 - 3 | 14 - 3 | 24 - 2 | 34 - 2 |
| 5 - 5 | 15 - 2 | 25 - 3 | 35 - 5 |
| 6 - 3 | 16 - 4 | 26 - 1 | 36 - 3 |
| 7 - 4 | 17 - 5 | 27 - 4 | 37 - 2 |
| 8 - 2 | 18 - 3 | 28 - 5 | 38 - 1 |
| 9 - 5 | 19 - 1 | 29 - 2 | 39 - 4 |
| 10 - A G J M | 20 - 2 | 30 - 3 | 40 - 4 |



(14) WWW.PastPapers.WiKi (14)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න